


# ජාතික විශ්‍රාමික දිනය

ඔක්තෝම්බර් 08



# පරපුරක අභිමානය



**සේවයෙන් විශ්‍රාම ලැබූ රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨයන් සැමරෙන දිනය සෑම වසරකම ඔක්තෝබර් මස 08 වැනිදාට යෙදී තිබේ. උද්යෝගිමත් සහ ජවසම්පන්න තාරුණ්‍යයේ ශක්තීන් ජාතියේ උන්නතිය වෙනුවෙන් කැප කළ පරපුරක පුරුකක් වූ සියලු දෙනා අභිමානයෙන් සිහිපත් කිරීමට මෙම දිනය කැප කර ඇත්තේ අසීමිත ගෞරවයකින් යුතුවය. රටේ ජීවය බඳු වූ ශ්‍රම බලකායේ කොටස්කරුවන්වෙමින් ලබා දුන් අපරිමිත දායකත්වය සදා සිහිපත් කළ යුතුය.**

එකී මෙහෙවරට ලබා දෙන ඉහළම ප්‍රණාමය ලෙස විශ්‍රාමික සැඳෑ ජීවිතය ආර්ථික සමාජයීය මෙන්ම සෞඛ්‍ය හා අධ්‍යාත්මික වශයෙන් ද අර්ථපූර්ණ කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වන අපගේ වගකීම වන්නේය.

සෑම මසකම ඔක්තෝබර් 10 වැනිදා හෝ ඊට පෙර දිනකදී විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ විශ්‍රාමිකයන්ගේ අතට පත් කිරීම අපගේ පළමු සහ පරම වගකීම වන අතර අඩ සියවසකට අධික විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ගමන් මග තුළ එය නොපිරිහෙලා ඉටු කර ඇත.

ඉන් ඔබ්බට ගොස් ඩිජිටල් තාක්ෂණික උපාය මාර්ග හා සන්නිවේදන නව්‍යකරණයන් හා යාවත්කාලීන වෙමින් රාජ්‍ය අංශයේ ප්‍රමුඛතම සමාජ ආරක්ෂණ ක්‍රමය වන 'ජාතික විශ්‍රාම වැටුප් ක්‍රමය' අන්තර්ජාතික ප්‍රමිතීන් වෙත ඔසවා තැබීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඉකුත් වසර කිහිපයක කාලය තුළ මහත් පරිශ්‍රමයක් දරා ඇත.

විශ්‍රාම වැටුප් ඇතුළු සියලු ප්‍රතිලාභ ගෙවීම් පද්ධති සරල කිරීමට හැකියාව ලැබී ඇත්තේ ඒ අනුවයි.

විශ්‍රාම වැටුප ලබා ගැනීමේ සෑම පියවරක්ම ඩිජිටල් පද්ධතීන් ඔස්සේ තවදුරටත් සුහුරු වනු දැකීමත් වර්තමාන ආර්ථික හා සමාජයීය යථාර්ථයන්ට අනුරූපී ලෙස විධිමත් හා අවිධිමත් අංශයන් ඇතුළත් ඉතා පුළුල් සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් හඳුන්වා දීමත් අපගේ අභිප්‍රායයි.

පෑන් ඒෂියා බැංකුව
සැබවින්ම ශ්‍රී ලාංකීයයි
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

## ශ්‍රී ලංකාවේ ගරු අග්‍රාමාත්‍ය හා අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය හරිනි අමරසූරිය මැතිණියගේ 'ජාතික විශ්‍රාමික දින' පණිවිඩය



රටක ජීවනාලිය වන ශ්‍රම බලකායේ කොටස්කරුවෙකු වෙමින් මාතෘ භූමියේ උන්නතිය වෙනුවෙන් කැපවී රජයේ සේවය ලබා දුන් දායකත්වය සිහිපත් කරන ගෞරවණීය විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ දිනය අදට යෙදී තිබේ. 'ජාතික විශ්‍රාමික දිනය' දශක ගණනාවක ඔවුන්ගේ මෙහෙවරට පිදෙන සංකේතාත්මක උපහාරයක් පමණි. ඔවුන්ගේ සැඳෑ ජීවිතය ආර්ථික හා සමාජයීය වශයෙන් සවි බල ගැන්වීම දියුණු ජාතියක් ලෙස ලබා දිය හැකි ඉහළම උපහාරය වන්නේය.

ආර්ථික හා සමාජයීය වශයෙන් ශක්තිමත් පුරවැසියකු පමණක් නොව විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසි ඔබ වෙත සෞඛ්‍ය සම්පන්න, අධ්‍යාත්මික වශයෙන් පරිපූර්ණ, දියුණු සංස්කෘතික පුරවැසියකු ලෙස ජීවත්වීම සඳහා අවකාශය සැලසීම ද අපගේ පරම වගකීමක් වේ.

ආරක්ෂිත සමාජයක් සහ සුපෝෂිත ජාතියක් දැක්ම කරගත් නව රජයේ ප්‍රතිපත්තීන් තුළ ජාතික විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තීන් තිරසරව හා අඛණ්ඩව පවත්වා ගනිමින් විධිමත් හා අවිධිමත් අංශයන්හි දායකත්වය සහිතව සැමට විශ්‍රාම වැටුපක් ලබා දීමේ පුළුල් ප්‍රතිපත්තියක් පවත්නා ආයතනික රාමුව තුළ සකස් කර ක්‍රියාත්මක කිරීම අනාගතයේ දී සිදුවනු ඇත.

මේ වන විට සිය මෙහෙවර නිම කළ සක්‍රීය විශ්‍රාමිකයන්ගේ සාමූහිකය 720,000 ඉක්මවා ගොසිනි. 2024 වසරේ දී රජය විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රු. බිලියන 434කට අධික මුදලක් වෙන් කර ඇත.

මෙරට සෑම පුරවැසියක්ගේම සැඳෑ ජීවිතය අධ්‍යාත්මික, සමාජයීය, ආර්ථික යන සෑම අංශයකින්ම දියුණුවට පත් කිරීම අපගේ අරමුණයි. එම අරමුණ පෙරදැරිව සෑම පුරවැසියකුටම විශ්‍රාම වැටුපක් හිමිවන පුළුල් සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලක් නිර්මාණය කිරීමේ දී ඔබ ද එහි කොටස්කරුවන් වනු නොඅනුමානය.

රාජ්‍ය සේවයේ වසර ගණනාවක අත්දැකීම්, පරිචය සහ ජීවිත කාලය පුරාම වැඩි දියුණු කරගත් යහපත් ආකල්ප, රටේ මතු පරපුර වෙනුවෙන් දායාද කරමින් තව දුරටත් සක්‍රීය පුරවැසියකු ලෙස සමාජ ප්‍රගමණයට ඔබ දායකවනු දැකීම අපගේ අභිලාෂයයි.

ඔබ සැමට නිදහස් නිවහල් සුවබර විශ්‍රාම දිවියක් පතමි.

**අග්‍රාමාත්‍ය**
**හරිනි අමරසූරිය**
**අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා,**
**පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය**

## අධිකරණ,රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ජාතික විශ්‍රාමික දින සුබ පැතුම් පණිවිඩය



රජයේ සේවයෙන් විශ්‍රාම ගන්වන නිලධාරියාට පමණක් නොව ඔහුගෙන් මතු උරුමකරුවන් වෙතත් ප්‍රතිලාභ හිමි ගන්වන සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ලෙස මෙතෙක් පැමිණි දුර සලකා බැලීමේ දී ශ්‍රී ලංකාවේ ජාතික විශ්‍රාමික ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යාම රටක් ලෙස ලැබූ ජයග්‍රහණයකි.

නියමිත වේලාවට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීමෙන් නොනැවතී සක්‍රීය සමාජ ක්‍රියාකාරිකයකු හා ගෞරවණීය පුරවැසියකු ලෙස ජීවිතය ගත කිරීම සඳහා අවශ්‍ය සියලු අවස්ථා විශ්‍රාමිකයා වෙත ලබා දීම අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය අභිලාෂය වන්නේය.

ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ විකාශනය සැලකීමේ දී නිසි මොහොතේ අත්‍යාවශ්‍ය ප්‍රතිපත්ති තීන්දු තීරණ ගැනීම මෙන්ම එම තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමෙහිලා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ද ඉතා වැදගත්ය.

මෙම අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ආයතන අතර ඩිජිටල් තාක්ෂණය හා සුහුරු පරිවර්තනයන් නිරන්තරයෙන් උකහා ගන්නා රාජ්‍ය ආයතනයක් ලෙස විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රමය සරල කිරීමටත් විශ්‍රාමිකයා අතට පත් කිරීමේ යාන්ත්‍රණය සුව පහසු කිරීමටත් ගන්නා ප්‍රයත්නය අගය කළ යුතුය.

එය හුදෙක් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය සඵල කිරීමක් ලෙස පමණක් නොසලකන අතර එය මේ රටේ විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් ලබා දුන් ගෞරවණීය සැලකිල්ලක් ලෙස විශ්වාස කරන්නෙමි.

ජාතික විශ්‍රාම වැටුප් ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම තවදුරටත් තහවුරු කිරීම හා විශ්‍රාමික හිමිකම් සුරක්ෂිත කිරීමට අප බැඳී සිටින බව ද ජාතික විශ්‍රාමික දිනය සැමරෙන මේ මොහොතේ සිහිපත් කරමින් සමස්ත විශ්‍රාමික ප්‍රජාව වෙත නීරෝගී හා අර්ථවත් විශ්‍රාම දිවියක් ප්‍රාර්ථනා කරමි.

**එස් ආලෝක බණ්ඩාර**
**ලේකම්**
**අධිකරණ,රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා,**
**පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය**

## විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ජාතික විශ්‍රාමික දින සුබ පැතුම් පණිවිඩය



මධ්‍යම රජය, පළාත් රාජ්‍ය සේවා, සන්නද්ධ හමුදා මෙන්ම අධිකරණ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වසර 1970 දී "A" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ස්ථාපිත කරනු ලැබිණි.

විශ්‍රාම වැටුප, වැන්දඹු විශ්‍රාම වැටුප, වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප, අනත්දරු විශ්‍රාම වැටුප, ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප, හමුදා හා සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප, මෙන්ම වන්දි ගෙවීම් සහ එක්වරක් පමණක් ගෙවනු ලබන පාරිතෝෂිත දීමනා,මරණ පාරිතෝෂික ගෙවීම්, රාජ්‍ය සේවා අර්ථ සාධක ගෙවීම් ද ඇතුළත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පුළුල් විෂය පථය රටේ සැලකිය යුතු කොටසකගේ සමාජ ආරක්ෂණ හිමිකම් තහවුරු කරනු ලබයි.

මෙම සියලුම විෂය පථයන් ආවරණය වන පරිදි විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරන අතරම එම ගෙවීම් ක්‍රියාවලිය ඩිජිටල් තාක්ෂණික ක්‍රමෝපායන් හා සන්නිවේදන ක්‍රියාවලියක් ඔස්සේ බද්ධ කරනු ලැබූ පසුගිය දශකයෙන් ආසන්න වසර අටක කාල සීමාව තුළ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

ගෙවීම් ක්‍රියාවලිය තුළ තොරතුරු තාක්ෂණ භාවිතය උපරිම කිරීමට අප ගත් ප්‍රයත්නයන් තුළ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියේ අදියර ගණනාවක් මාර්ගගත ක්‍රමය හා යා කිරීමට අපට හැකියාව ලැබිණි. විශ්‍රාම වැටුප් ඇතුළු සියලුම ප්‍රතිලාභ ගෙවීමේ පද්ධති සරල කිරීම ඒ අනුව අඛණ්ඩව සිදුවෙමින් පවතී. කවර අභියෝගාත්මක වාතාවරණයක දී වුවත් ගෙවීම් ක්‍රියාවලියට බාධා නොවන ලෙස එම පද්ධති පවත්වා ගෙන යාමට එමගින් ඉඩ සැලසෙනු ඇත.

රජය විසින් ජාතික අයවැයෙන් 2024 වර්ෂය සඳහා රු බිලියන 435කට අධික මුදලක් වෙන් කරමින් සෑම මසකම 10 වැනිදා හෝ ඊට පෙර දිනකදී 720,000 ක් ඉක්මවූ සක්‍රීය විශ්‍රාමිකයන් අතට විශ්‍රාමික ප්‍රතිලාභ පත් වන්නේ ගෙවීම් ක්‍රියාවලියේ මෙම සංකීර්ණ බව නොදැනෙන පරිදිය.

ජාතික විශ්‍රාම වැටුප් ක්‍රමයේ ප්‍රතිසංස්කරණ යනු නිරන්තරයෙන් අභියෝගයට ලක් වන්නකි. කවර හෝ මූල්‍ය පීඩනයන්ට යටත් නොවන රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ මැදිහත් වීමෙන් සිදුවන තිරසාර සමාජ ආරක්ෂණ ක්‍රමයන් වෙත ලොව බලගතුම රාජ්‍යයන් පවා පිය නගමින් සිටින්නේය. වසර සිය ගණනාවක් පැරණි විශ්‍රාම වැටුප් ක්‍රමය වර්තමානයට ගැළපීම සඳහා අවශ්‍ය සංශෝධනයන් සඳහා ගත යුතු ක්‍රියාමාර්ග වෙත රජයේ අවධානය යොමු කිරීමට අප කටයුතුකර ඇත්තේ ඒ අනුව බව ද සිහිපත් කළ යුතුය.

විශ්‍රාමය වර්ණවත් හා අර්ථපූර්ණ කාලපරිච්ඡේදයක් කිරීමට අප ඉදිරියටත් කැප වී සිටින අතර ශ්‍රී ලාංකික සමස්ත විශ්‍රාමික ප්‍රජාව වෙත ගත සිත සවිමත් නීරෝගීමත් විශ්‍රාම දිවියකට සුබ ප්‍රාර්ථනා කරමි.

**ඒ.ජගත් ඩී.ඩයස්**
**විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්**



# ජාතික විශ්‍රාමික දිනය

ඔක්තෝම්බර් 08

# ඔබගේ ආයතනයේ සේවයකර විශ්‍රාම ලබන නිලධාරියකුට කඩිනමින් විශ්‍රාම වැටුප ලබා දීමට නම්

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලබන නිලධාරින්ට ඔවුන් විශ්‍රාම ගනු ලබන දිනයට පසුව එළඹෙන විශ්‍රාම වැටුප් දිනයේදීම විශ්‍රාම හිමිකම් ප්‍රදානය කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අභිප්‍රාය වේ. යම් ආයතනයක සේවයකර විශ්‍රාම යන නිලධාරියකුට කඩිනමින් විශ්‍රාම හිමිකම ලබා දීමත්, සේවය කරන අතරතුර හදිසියේ මිය යන නිලධාරියෙකුගේ යැපෙන්නන් වෙත කඩිනමින් වැන්දඹු විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීමත් මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමුකළ යුතුව ඇත. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2015 මගින් මේ සම්බන්ධ සියලු ආයතනවලට අවශ්‍ය උපදෙස් නිකුත් කර ඇත.



සෑම අමාත්‍යාංශයකම/ දෙපාර්තමේන්තුවකම/ ආයතනයකම සේවය කරන නිලධාරි සංඛ්‍යාව අනුව එහි පාලන අංශය යටතේ විශ්‍රාම වැටුප් අංශයක් (අවස්ථාවෝචිත පරිදි නිලධාරින් කිහිපදෙනෙකු සහිතව) ස්ථානගත කළ යුතුය. තම ආයතනයේ සේවය කරන විශ්‍රාම යාමට නියමිත එනම් වයස අවුරුදු 54 ඉක්මවූ නිලධාරීන්ගේ දත්ත පද්ධතියක් සකස්කර එය යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. නිලධාරියාගේ නම, තනතුර, මුල් පත්වීම් දිනය, උපන් දිනය, ජාතික හැඳුනුම්පත් අංකය එම පද්ධතියට ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය වේ. එමගින් වෛකල්පිත විශ්‍රාමයාමේ වයසට එළඹෙන නිලධාරින්ගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාකර විශ්‍රාම ගැන්වීමට අදාල ලියවිලි සකස් කිරීම සඳහා අවධානය යොමු කිරීමට අවස්ථාව සැලසේ.

විශ්‍රාම ගැන්වීමට අදාල මූලික කාර්යයන් ඉටුකරනු ලබන්නේ පෞද්ගලික ලිපිගොනුව පදනම් කරගෙන බැවින් සෑම රාජ්‍ය නිලධාරියෙකුගේම පෞද්ගලික ලිපිගොනුව නිසි පරිදි පවත්වාගෙන යා යුතුය. ප්‍රධාන වශයෙන් නිලධාරියාගේ පත්වීම් ලිපිය, උප්පැන්න සහතිකයේ මුල් පිටපත, සේවය ස්ථිර කිරීමේ ලිපිය, කාර්යක්ෂමතා කඩඉම් සමත්වූ ලිපි, උසස්වීම හා සේවයේ සිදුවන වෙනස්කම් වලට අදාල ලිපි හා විනය නියෝග ලිපි ආදිය පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කළ යුතුය. එසේම රාජ්‍ය සේවයට පත්වූ දිනසිට නිලධාරින්ගේ චර්යා සටහන් පත්‍රය නිවැරදිව පවත්වාගෙන යාම හා එය නිසි පරිදි යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය කාර්යයක් බව හඳුනාගෙන ඇත. මේ ආකාරයට පෞද්ගලික ලිපි ගොනුව නඩත්තු කිරීම විශ්‍රාම හිමිකම් පිරිනැමීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට මූලික සාධකයක් වන බව සඳහන් කළ යුතුය.

වෛකල්පිත විශ්‍රාම යාමේ වයසෙන් පසු අනිවාර්යය විශ්‍රාම ගැනීමේ කාලය තුල ඕනෑම අවස්ථාවක නිලධාරියෙකුට විශ්‍රාම යාමට ඉල්ලුම් කළ හැකි බැවින් වයස අවු 54 ඉක්මවූ සෑම නිලධාරියෙකුගේම පෞද්ගලික ලිපිගොනුව වාර්ෂිකව මාණ්ඩලික නිලධාරියා විසින් අධීක්ෂණය කිරීම මගින් විශ්‍රාම යන අවස්ථාවේදී මුහුණ දීමට සිදුවන විවිධ දුෂ්කරතා අවමකර ගැනීමට අවස්ථාව සැලසේ. විශ්‍රාම යන නිලධාරියාට හිමි උසස් වීම්, වැටුප් වර්ධක නියමිත දිනට ලබා දීම, නිවැරදි සේවා කාලය ගණනය කිරීම, නිවාඩු පිළිබඳ තොරතුරු නිවැරදිව යාවත්කාලීන කිරීම අදාල මාණ්ඩලික නිලධාරින්ගේ වගකීමකි. පෞද්ගලික තොරතුරු නිසි පරිදි යාවත්කාලීන නොවීමෙන් නැවත සංශෝධිත විශ්‍රාම වැටුප් අයදුම් පත් ඉදිරිපත් කිරීමට සිදුවන බැවින් විශ්‍රාමිකයා මෙන්ම ආයතන වලටද අතිරේක වැඩ ප්‍රමාණයක් එකතුවීම සිදුවේ. එය රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට ද බලපාන කරුණකි.


ඉතා විශේෂ අවස්ථාවලදි නිලධාරියෙකුගේ සේවා සටහන් වලට අදාල ලියකියවිලි හා තොරතුරු සොයාගැනීමට නොහැකි තත්ත්වයක් ඇතිවිය හැකිය. (උදා :- සුනාමි ව්‍යසනය, ගංවතුර හානි) එවැනි පාලනය කළ නොහැකි සාධක මත ලිපිගොනු අස්ථානගත වූ විට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මාණ්ඩලික නිලධාරින් දෙදෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණ කමිටුවක් පත්කර අස්ථානගත සේවා කාලය සම්බන්ධයෙන් කමිටු නිර්දේශයක් ලබාගෙන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුය. මෙවැනි කටයුතු නිලධාරියා විශ්‍රාම ගන්වන අවස්ථාව වනතෙක් නොසිට පූර්වයෙන් සම්පූර්ණ කර ගැනීමට විශ්‍රාම වැටුප් හිමිකම් කඩිනම් කිරීමට හේතු වේ.

නිලධාරියෙකු හදිසියේ මියගිය පසු වැන්දඹු අනත්දරු විශ්‍රාම ප්‍රතිලාභ ලබාගැනීමේදි වැන්දඹු කාන්තාවක් දැඩි අසරණ තත්ත්වයට පත්වීම,අනත්දරු ප්‍රතිලාභ ප්‍රමාද වීම, ආබාධිත විශ්‍රාම වැටුප් සකස් කිරීමට දිගුකලක් ගතවීම විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය තුල හඳුනාගෙන ඇති තවත්විශේෂ ගැටළුවකි. මීට හේතුව වන්නේද නිලධාරියෙකුගේ පෞද්ගලික

ලිපි ගොනුවට ඇතුලත්ව තිබිය යුතු මතු සඳහන් ලේඛන ඒ ඒ අවස්ථාවේදි ගොනුවට ඇතුලත් කිරීම සඳහා නිලධාරියා මෙන්ම නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව භාරව කටයුතු කරන නිලධාරියාද අවධානය නිසි පරිදි යොමු නොකිරීමයි. නිලධාරියාගේ විවාහ සහතිකය, පෙර විවාහයන් පැවතියේ නම් එය අවසන් වූ ආකාරය සනාථ කරන ලිපි, කලත්‍රයාගේ හා දරුවන්ගේ උප්පැන්න සහතිකවල මුල් පිටපත්, කලත්‍රයාගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක්, කලත්‍රයා මියගොස් ඇත්නම්මරණ සහතිකයේ මුල් පිටපත, දික්කසාද වි ඇත්නම් අධිකරණ නියතතීන්දුව ආදි ලිපි ලේඛන වලින් ඒ ඒ නිලධාරියාට අදාළ වන ලේඛනපෞද්ගලික ලිපිගොනුවට ඇතුලත් කර තිබිය යුතුය.විශ්‍රාම යාමට මාස 06 කට ප්‍රථම තම පත්වීම් බලධාරියා වෙත තමන්විශ්‍රාම යන බව දන්වා ඊට අනුමැතිය ලබා ගැනීම අදාල නිලධාරියාගේවගකීම වේ. විශ්‍රාම යාමට නියමිත දිනයට මාස තුනකට පෙර සිටවිශ්‍රාම වැටුප් අයදුම්පත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතනිවැරදිව යොමු කිරීමට කටයුතු කළ යුතුය. මාර්ගගත ක්‍රමයටයොමුකළ අයදුම්පත් සම්බන්ධයෙන් මාර්ගගත ක්‍රමයට විශ්‍රාම වැටුප්දෙපාර්තමේන්තුව විසින් කරන දැනුම් දීම සඳහා කඩිනම් ප්‍රතිචාරදැක්වීමක් මාර්ගගත නොවන ක්‍රමයට යොමුකරන අයදුම්පත්සම්බන්ධයෙන් අදාල නිවැරදි කිරීම් සිදුකර නැවත විශ්‍රාම වැටුප්දෙපාර්තමේන්තුවට යොමුකිරීමත් මගින් විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියකඩිනම් කර ගැනීමට හැකියාව ලැබේ. විශ්‍රාම වැටුප් අනුමත වීමේන්පසු සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර ඒ සඳහා විශ්‍රාමික නිලධාරියාරගෙන පැමිණිය යුතු ලිපි ලේඛන පිළිබඳව දැනුවත් කිරීමද විෂය භාර නිලධාරියා විසින් සිදුකරනු ඇත.ලේඛන පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත්කර තිබිය යුතුය.

යම් නිලධාරියෙකු සම්බන්ධයෙන් ගත් කල ඔහුගේ ස්ථිර පත්වීම වයස අවු 45 ඉක්මවීමෙන් පසු ලැබී තිබීම, පත්වීම ස්ථිරකර නොතිබීම, සේවය හැර යාම් , නැවත සේවයේ පිහිටුවීම් සම්බන්ධ ගැටළු, වෙනත් සේවාවන් සඳහා තාවකාලිකව මුදා හැරීම්, විදේශ පුහුණු කාලයකින් පසු නියමිත සේවා කාලය සම්පූර්ණ නොකිරීම වැනි ගැටළු පවතීනම් ඒ සම්බන්ධයෙන් විශ්‍රාම ගැනීමේ අවස්ථාවට පෙර විධිමත් ක්‍රියා මාර්ග ගෙන තිබීම මගින් විශ්‍රාම වැටුප් හිමිකම් ප්‍රදානය කිරීම කඩිනම්කර ගැනීමට අවස්ථාව උදාකර ගත හැකිය.

විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවත් විශ්‍රාමිකයාත් විශ්‍රාමිකයා සේවය කළ ආයතනයත් අතර පවතින සාමූහික ක්‍රියාවලියක අවසාන ප්‍රතිඵලය බැවින් මෙම පාර්ශ්ව තුනම විධිමත්ව නිවැරදිව කාර්යක්ෂමව ක්‍රියාත්මක වීම මගින් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා රාජ්‍ය නිලධාරියාට සතුටින් විශ්‍රාම දිවියට පියනැගීමට අවස්ථාව උදාවනු ඇත.



# උපදෙස් හා මග පෙන්වීම් තුළින් කාර්යක්ෂම හා විධිමත් සේවාවක්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මේ වන විට 720,000 කට ආසන්න විශ්‍රාමිකයන් සංඛ්‍යාවක් වෙත ප්‍රථම විශ්‍රාම වැටුප හා වැන්දඹු අනත් දරු විශ්‍රාම වැටුප ඇතුළු පසු ප්‍රතිලාභ හිමි ගැන්වීම සිදුකරයි.

විශ්‍රාම වැටුප් හිමිකම සම්බන්ධ වහා ගෙවීම් ක්‍රියාවලියට අදාළව 2023 හා 2024 වසර වලදී දෙපාර්තමේන්තු මට්ටමින් ඉතා වැදගත් තීන්දු තීරණ ලබා ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට කටයුතුකර ඇත.


එකී තීන්දු තීරණ අනුව විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය හා ඊට අදාළව කටයුතුවල සිදුවූ පරිවර්තනීය වෙනස්කම් හා සාක්ෂාත් කරගත් ඉලක්ක පහත පරිදිවේ.

- **පාරිතෝෂික ගෙවීම් කාර්යක්ෂම කිරීම**
  2024 අගෝස්තු මාසය තෙක් ප්‍රථම විශ්‍රාම වැටුප් සක්‍රියකර ඇති සියලුම විශ්‍රාමිකයින් සඳහා පාරිතෝෂික ගෙවීම් සිදුකර ඇති අතර මේ වන විට විශ්‍රාම වැටුප් ආරම්භ කළ මාසයේ දීම පාරිතෝෂික ගෙවීම් සිදු කරනු ලැබේ. එසේම පාරිතෝෂික ගෙවීම් චෙක්පත් මගින් 2024 මාර්තු මස දක්වා සිදු වූ නමුත් මේ වන විට ස්ලිප් ක්‍රමය (Slip method) හරහා ගෙවීම් කිරීම ආරම්භ කොට ඇති බැවින් විශ්‍රාමිකයින්ට ප්‍රමාදයකින් තොරව තම ප්‍රතිලාභ අත්කර ගැනීමට පහසුකම් සලසා ඇත. ඒ අනුව 2024 අගෝස්තු 31 වන විට විශ්‍රාමිකයින් 26,792 ක් සඳහා පාරිතෝෂික ගෙවීම් සිදුකර ඇත.

- **වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් අයකිරීමේ දී ඊට අදාල පොළිය අය කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් ලබාදීම.**

  හිඟ වැන්දඹු අනත් දරු දායක මුදල් ගෙවීමේදී අයකරනු ලබන පොළී ප්‍රතිශතය හා පොළී ක්‍රමය පිළිබඳ මතු වී තිබූ ගැටළු සහගත තත්ත්වය නිරාකරණය කිරීම සඳහා ගරු නීතිපතිතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් හා පළාත්පාලන අමාත්‍යාංශ ලේකම් විසින් ලබා දෙන ලද උපදෙස් හා මග පෙන්වීම අනුව 2024.04.02 දිනැතිව විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 01/2024 නිකුත්කර ඇත. ඒ අනුව 2023.06.01 දිනට පෙර කාල සීමාවන්ට අදාළව වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් අයකිරීමේ දී ඊට අදාළව 4%ක සුළු පොළියක් අය කිරීමට කටයුතු කළ යුතුය. 2023.06.01 දිනට පසු කාල සීමාවන්ට අදාළව වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් අයකිරීමේ දී ඊට අදාළව 4%ක වැල් පොළියක් අය කිරීමට කටයුතු කළ යුතුය.

- **ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් සඳහා රු.5000.00 ක මාසික දීමනාව ගෙවීම**
  2024.08.06 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 06/2024 මගින් ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දුබලතාවට පත්ව ඇති ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් වෙත ද මිය ගොස් ඇති එම නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත ද වයස අවුරුදු 55 දක්වා වන්දි වැටුප් හා දීමනා ගෙවීමේදී ඊට අදාලව රු.5000.00 ක මාසික දීමනාව හිමිගැන්වීම පිළිබඳ කටයුතු ත්‍රිවිධ හමුදාව හා පොලිසිය යන ආයතන වෙත පවරා ඇත.







- **වැන්දඹු අනත්දරු ගෙවීම් කාර්යක්ෂම කිරීම**
  2024.08.01 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 05/2024 මගින් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2020 හි විධිවිධාන ප්‍රකාරව මාර්ගගත දත්ත පද්ධතිය හරහා යොමු කළ නොහැකි වැන්දඹු/ වැන්දඹු පුරුෂ/ අනත්දරු/ ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර DS Portal දත්ත පද්ධතිය මගින් ඇතුළත් කිරීමට අවස්ථාව ලබාදීම තුළින් වැන්දඹු අනත්දරු ගෙවීම් කාර්යක්ෂම කිරීම සඳහා කටයුතු කර ඇත.

- **වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයේ ලියාපදිංචිය**
  2024 අගෝස්තු 31 දින වන විට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයේ ලියාපදිංචිය සඳහා ලැබී ඇති අයදුම්පත් වලින් 29,513 ක් සඳහා සාමාජික අංක නිකුත් කර ඇත.

- **දත්ත පද්ධතීන් වැඩිදියුණු කිරීම**
  හමුදා විශ්‍රාම වැටුප් සඳහා සංශෝධනයන් සිදු කළ යුතු වන අවස්ථාවන්හි දී එය වඩාත් නිරවද්‍ය හා කාර්යක්ෂම ආකාරයෙන් සිදු කළ හැකි වන පරිදි හමුදා විශ්‍රාම වැටුප් සංශෝධනය සඳහා තොරතුරු පද්ධතියක් (PD 6 Forces) සකස්කර මාර්ගගතව මුදා හැර ඇත.
  ඒඅනුව,
  වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසුව අවුරුදු 55 දී ලැබුණු වැටුප මත පදනම්ව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප සංශෝධනය සඳහා අදාළ අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කළ යුතුය.ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රතිශෝධන සිදු කිරීමෙන් පසුව ස්ථාවර දීමනා ගෙවීම සඳහා අයදුම්පත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.




- **2016.01.01 දිනෙන් පසු මියගිය නිලධාරීන් වෙනුවෙන් මරණ පාරිතෝෂිකය හිමිගැන්වීම**
  2016.01.01 දිනට පසුව ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලබා සේවයේ යෙදී සිටිය දී මියගොස් ඇති රාජ්‍ය නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂික හිමිකම ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.ඒ අනුව මරණ පාරිතෝෂික හිමිගැන්වීමට අදාළ කටයුතු 2023 දෙසැම්බර් මස සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර ඇත. 2016.01.01 න් පසු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලබා දැනට සේවයේ යෙදී සිටින නිලධරයකු යම් හෙයකින් ඉදිරියේදී මියගියහොත් ඔවුන්ගේ යැපෙන්නන් වෙත ද මෙම හිමිගැන්වීම සිදු කෙරේ.

- **ආබාධිත අනත්දරුවන් වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම**
  ආබාධිත දරුවන් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වෙත යොමු කිරීමේ දී භාවිත කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාව සහිතව නව අයදුම්පතක් හඳුන්වා දී ඇත. රජයේ සේවයේ නිරතව සිටින නිලධාරින්ට ආබාධිත දරුවන් සිටී නම් නිලධරයා සේවය කරන ආයතනය මගින් ඔවුන් වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතුය. වෛද්‍ය මණ්ඩල වාර්තාව ලද පසු එය නිලධරයාගේ පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කළ යුතු අතර එහි පිටපතක් කලත්‍රයාගේ පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කළ යුතුය. විශ්‍රාමිකයින්ට ආබාධිත අනත්දරුවන් සිටී නම් හා ඔවුන් වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කර නොමැති නම් විශ්‍රාමිකයා අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය. වෛද්‍ය මණ්ඩල වාර්තාව ලද පසු එය විශ්‍රාම වැටුප් ලිපිගොනුවට ඇතුළත් කළ යුතුය. විදේශ විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයෙකුට අබාධිත දරුවන් සිටී නම්, එම දරුවන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විදේශ විශ්‍රාම වැටුප් අංශය මගින් වෛද්‍ය මණ්ඩල වෙත යොමු කළ යුතුය. වෛද්‍ය මණ්ඩල වාර්තාව ලද පසු එය විශ්‍රාම වැටුප් ලිපිගොනුවට ඇතුළත් කළ යුතුය.

- **දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා නිලධාරීන්ට අදාළව වැන්දඹු අනත්දරු ප්‍රේෂණ කළමනාකරණ පද්ධතිය හඳුන්වා දීම.**
  රාජ්‍යපරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට අදාළ සංශෝධන අනුව දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා රාජ්‍ය නිලධාරීන්ගේ නිවාඩු කාලසීමාව තුළ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට අදාළ දායක මුදල් ප්‍රේෂණය කිරීම සඳහා වැන්දඹු අනත්දරු ප්‍රේෂණ කළමනාකරණ පද්ධතිය සකස්කර ඇත. මෙම පද්ධතිය හරහා මාසිකව හෝ ත්‍රෛමාසිකව වැන්දඹු අනත්දරු දායක මුදල් වලට අදාළ ප්‍රේෂණ ස්ථාවර නියෝග මගින් යොමු කිරීමට හැකියාව ඇත. ඉහත පරිදි ගෙවනු ලබන දායක මුදල් හා ඊට අදාළ ගිණුමේ විස්තර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා ලබා ගැනීමට ගෙවීම් කරන නිලධරයාට හැකියාව ඇත.

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන් මග

1. විශ්‍රාම වැටුප් පසු ප්‍රතිලාභ අයදුම්පත් හා ලිපි ලේඛන ලබා ගැනීම සඳහා සම්පූර්ණයෙන්ම මාර්ගගත (Online) ක්‍රමයන් හඳුන්වාදීම හා වැඩිදියුණු කිරීම.
2. මරණය ලියාපදිංචි කිරීම සඳහා මාර්ගගත (Online) ක්‍රමයක් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම.
3. විශ්‍රාම වැටුප් විෂය සම්බන්ධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4. රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී වයස අවුරුදු 45 ඉක්මවා බඳවා ගැනීම් හේතුවෙන් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිගැන්වීම පිළිබඳ ඇතිව තිබෙන ගැටළුව නිරාකරණය කරගැනීම.
5. පළාත් ආණ්ඩුකාරවරුන් හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා මගින් සහ මධ්‍යම රජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන එකම කරුණු සම්බන්ධයෙන් විවිධ ආකාරයන්ට අනුගමනය කිරීම හේතුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීමේදී පැනනැගී ඇති ගැටළු සඳහා පොදු විසඳුමක් ලබාගැනීම.
6. යුදමය තත්ත්වය හේතුවෙන් ත්‍රිවිධ හමුදා හා පොලිසියේ මියගිය හා ආබාධිත බවට පත්වූ සාමාජිකයින් සහ ඔවුන්ගේ පසු ප්‍රතිලාභීන් සම්බන්ධ දත්ත පද්ධතිය යුධ හමුදා සහාය ලබාගෙන සම්පූර්ණ කිරීම.
7. නව ජාතික දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය හඳුන්වාදීම සඳහා සහයවීම.
8. යුද්ධය හේතුවෙන් මියගිය ත්‍රිවිධ හමුදා හා පොලිස් සාමාජිකයින්ගේ වැන්දඹුවන්ට හා දෙමාපියන්ට ගෙවන පසු ප්‍රතිලාභ සහ එම හේතුවෙන්ම මියගිය රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ වැන්දඹුවන්ට හා මවුපියන්ට ලැබෙන ප්‍රතිලාභයන්හි විෂමතාව අවම කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම.
9. දුම්රිය දෙපාර්තමේන්තුව, මොබිටෙල් ආයතනය සමඟ එක්ව විශ්‍රාමිකයන්ට විශ්‍රාමික නිවාඩු දුම්රිය බලපත්‍ර මාර්ගගත (Online) ක්‍රමවේදයන් ඔස්සේ ලබාගැනීමේ ක්‍රමවේදය දියත් කිරීම.
10. විශ්‍රාමික ලිපිගොනුවල පවතින ලිපිලේඛණ අඩුපාඩු හේතුවෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2015 හා 14/2019 විශ්‍රාම වැටුප් විෂමතාව ලබාදී නොමැතිව තවදුරටත් විශේෂ දීමනා ගෙවනු ලබන විශ්‍රාමිකයින් මූලික වැටුප් පියවරයන්හි හෝ තබා විෂමතා ඉවත් කිරීම.
11. විගණන හා විමර්ශන කාර්යයන් පුළුල් කිරීම.
12. රාජ්‍ය සේවයේ සේවකයන් සම්බන්ධ දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමට මහ භාණ්ඩාගාරය සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම.



# ජාතික විශ්‍රාමික දිනය



ඔක්තෝම්බර් 08

## මරණ පාරිතෝෂික හා වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වැන්දඹු අනත්දරු අංශයේ කාර්යභාරය සහ ශ්‍රී ලංකාවේ විවාහ නීතියේ අදාළත්වය

මෙරට ඉතිහාසය තුළ ප්‍රථමවරට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත්තේ 1898 වර්ෂයේ ජුනි මස 23 වන දින 1898 අංක 1 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ආඥා පණත ක්‍රියාත්මක කිරීම මගිනි. වර්තමානය වන විට වැන්දඹු අනත්දරු අංශය මගින් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගේ අනන්‍යතාවය තහවුරු කොට ඔවුන් වැන්දඹු අනත්දරු ක්‍රමයේ ලියාපදිංචි කිරීම, රාජ්‍ය සේවයේ යෙදී සිටිය දී විවිධ හේතූන් මත මියගිය නිලධාරීන් වෙනුවෙන් මරණ පාරිතෝෂික හිමිගැන්වීම, වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම, නිලධාරීන්ගේ වයස අවුරුදු 26 ට පෙර ආබාධිත තත්ත්වයට පත් වූ අනත්දරුවන් වෙනුවෙන් ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම, සන්නද්ධ සේවා නිලධාරීන් වෙනුවෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සහ නැවත විවාහ වූ කලත්‍රයන්ට 50% ක වැන්දඹු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සිදු කරයි.

වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපක් ලබා ගැනීම සඳහා මූලිකවම බලපාන සුදුසුකම වන්නේ අදාළ සාමාජිකයා හෝ සාමාජිකාව නීත්‍යානුකූලව විවාහ වී තිබීමයි. ශ්‍රී ලංකාවේ 1907 අංක 17 දරණ සාමාන්‍ය විවාහ සහ දික්කසාද ආඥා පණත අනුව සාමාජිකයා හෝ සාමාජිකාව නීත්‍යානුකූලව පිළිගත් වලංගු විවාහයකට එළඹ තිබීම අත්‍යවශ්‍ය වේ. නීත්‍යානුකූල විවාහයක් යනු නිලධාරියා විවාහයකට එළඹීම සඳහා අවශ්‍ය වන අවම වයස් සීමාව සම්පූර්ණ කිරීමෙන් පසු විවාහය සිදු කරගෙන තිබීමයි. 1995.10.18 දින නිකුත් කල 1995 අංක 18 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත අනුව වර්තමානය වන විට විවාහවීමට අදාළ අවම වයස් සීමාව වන්නේ අවුරුදු 18 වේ. එසේම එම විවාහය තහනම් ඥාති සබඳතාවක් මත වූවක් නොවිය යුතු ය.

යම් දායකයෙකු විසින් වලංගු විවාහ කිහිපයක් සිදුකර ගෙන ඇති අවස්ථාවක අවසාන වලංගු විවාහයේ කලත්‍රයාට හා පෙර විවාහයන්හි අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම සලකා බැලිය හැකි දරුවන් සිටින්නේ නම් එම දරුවන්ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිවේ. මෙහි දී අවසන් වලංගු විවාහයේ කලත්‍රයාට 50% ක් වූ වැන්දඹු විශ්‍රාම වැටුපක් ද පෙර විවාහයන් හි අනත්දරු හිමිකම සහිත දරුවන් වෙත 50% ක් වූ අනත්දරු විශ්‍රාම වැටුපක් ද හිමි ගන්වන අතර අනත්දරු හිමිකම අවසන් වීමෙන් පසු අවසන් වලංගු විවාහයේ කලත්‍රයා වෙත 100% ක් වූ වැන්දඹු විශ්‍රාම වැටුප සලකා බලනු ලැබේ.



මීට අමතරව විශ්‍රාම යාමෙන් පසුව සිදු කරගන්නා විවාහ සඳහා වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු හිමිකම ලබා ගැනීමට නොහැකි වේ. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු හිමිකම ලබා ගැනීමට නම් නිලධාරියා විශ්‍රාම යාමට පෙර විවාහ වී තිබීම අනිවාර්යම සාධකයක් වේ. මීට අමතරව දික්කසාදයක නෛසයි තීන්දුව ලබා විවාහ වූ පාර්ශ්වයන් නියත තීන්දුව ලබා ගෙන නැවත විවාහ වී ඇති අතර, එම විවාහය විශ්‍රාම යාමට පෙර සිදුකර ගෙන තිබේ නම් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු හිමිකම ලබා ගත් අවස්ථා ද පවතී.

නැවත විවාහ වූ කලත්‍රයන්ට 50% වැන්දඹු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප හිමිගන්වනු ලැබේ. කලත්‍රයා මෙතෙක් ලබමින් සිටි 100% වැන්දඹු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප 50% දක්වා අඩු කොට අඛණ්ඩව ගෙවනු ලැබේ. නැවත විවාහ වූ කලත්‍රයකු තම දෙවන විවාහය දික්කසාද වීම මත හෝ ශූන්‍ය හෝ, බල රහිත කිරීම අවලංගුකර තිබුණ ද, පනත ප්‍රකාරව නැවත විවාහයකට එළඹීම යන කාරණාව මත පමණක් පදනම්ව එම කලත්‍රයා වෙත ගෙවනු ලබන්නේ 50% වැන්දඹු විශ්‍රාම වැටුපක් පමණක් වේ. එය නැවත 100% දක්වා සංශෝධනය කරනු නොලැබේ.

කලත්‍රයා නැවත විවාහයකට එළඹෙන අවස්ථාව වන විට දායකයාගේ වයස අවුරුදු 26 ට අඩු රැකියා විරහිත දරුවන් සිටින්නේ නම් 100% ක් වූ අනත්දරු විශ්‍රාම වැටුප අනත්දරු හිමිකම අවසන් වන අවස්ථාව දක්වා එම දරුවන් වෙත හිමිගැන්වීමෙන් පසු 50% ක් වූ වැන්දඹු විශ්‍රාම වැටුප් හිමිකම කලත්‍රයා වෙත සලකා බලනු ලැබේ.

එමෙන් ම කලත්‍රයෙකු නැවත එළඹෙන්නා වූ විවාහයේ පුරුෂයා හෝ ස්ත්‍රිය රජයේ රැකියාවක නිරත වන්නේ නම් ඔහුගේ හෝ ඇයගේ මරණය සිදු වන තෙක් පෙර විවාහයේ දායකයා වෙනුවෙන් 50% ක් වූ වැන්දඹු / වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප හිමි ගන්වන අතර දෙවන විවාහයේ නිලධාරියාගේ මරණයෙන් පසු දින සිට එම විවාහය සඳහා 100% ක හිමිකම සලකා බලන බැවින් පෙර හිමිකම 2010 අංක 08 හා 09 දරන සංශෝධිත වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු පනත් ප්‍රකාරව නතර විය යුතුය.

තව ද සිරිත් විවාහ නීත්‍යානුකූලව ලියාපදිංචි කිරීමකින් තොරව වෛවාහක දිවි ගත කරන හා එම පුද්ගලයන්ට දාව දරුවන් බිහිකළ වැන්දඹු විශ්‍රාම වැටුප්ලාභීන්ට වෙන වෙනම විසඳුම් ලබා දීම අප අංශයෙන් සිදු වේ. තව ද මාතෘත්වය නෛසර්ගිකයි යන පදනම මත, වැන්දඹු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි අවිවාහක කාන්තා නිලධාරිනියන්ට උපන් දරුවන් වෙනුවෙන් එම සාමාජිකාව මියගිය පසු වයස අවුරුදු 26 ට අඩු දරුවන් වේ නම් ඔවුන්ට අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගන්වනු ලැබේ.

තව ද දෙපාර්තමේන්තු අහෝසි කිරීම මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2-7 වගන්තිය යටතේ විශ්‍රාම ගන්වන ලද නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ වයස අවුරුදු 55 දක්වා කෙරෙන විවාහ සඳහා දායකයාගේ ඇවෑමෙන් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගන්වනු ලබයි.

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව 2024 වසරේ අත්පත් කරගත් ප්‍රගතිය 2024 වසරේ සැප්තැම්බර් වන විට සක්‍රීය විශ්‍රාමිකයන් සංඛ්‍යාව 717,347

## සමස්ත විශ්‍රාම වැටුප් වියදම - රු. බිලියන 253

**සමස්ත විශ්‍රාම වැටුප් වියදම (2024 ජනවාරි - සැප්තැම්බර්**

| මාසය | සිවිල් | | වැ.අ.වි.වැ | | හමුදා | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | විශ්‍රාමිකයන් ගණන | මුදල ( රු. මිලියන ) | විශ්‍රාමිකයන් ගණන | මුදල ( රු. මිලියන ) | විශ්‍රාමිකයන් ගණන | මුදල ( රු. මිලියන ) | මුළු විශ්‍රාමිකයින් ගණන | මුළු මුදල ( රු. මිලියන ) |
| ජනවාරි | 384857 | 14,985 | 187689 | 5,262 | 131924 | 6,027 | 704,470 | 26,275 |
| පෙබරවාරි | 386744 | 15,516 | 187852 | 5,300 | 132746 | 6,177 | 707,342 | 26,992 |
| මාර්තු | 387909 | 15,344 | 188062 | 5,366 | 133261 | 6,162 | 709,232 | 26873 |
| අප්‍රේල් | 389421 | 16,458 | 188419 | 5,686 | 134175 | 6,585 | 712,015 | 28,729 |
| මැයි | 389021 | 16,104 | 188093 | 5,554 | 134397 | 6449 | 711,511 | 28106 |
| ජුනි | 389870 | 16,521 | 188095 | 5,604 | 134822 | 6,600 | 712,787 | 28,726 |
| ජූලි | 389307 | 16,576 | 186715 | 5,680 | 134693 | 6,625 | 710,715 | 28,881 |
| අගෝස්තු | 390969 | 16,722 | 187366 | 5,670 | 135485 | 6,665 | 713,820 | 29,057 |
| සැප්තැම්බර් | 392966 | 17,013 | 187913 | 6,184 | 136468 | 6,796 | 717,347 | 29,993 |
| එකතුව | | 145,240 | | 50,305 | | 58,086 | | 253,631 |

**පාරිතෝෂික ගෙවීම් (2024 සැප්තැම්බර් දක්වා)**

| මාසය | විශ්‍රාමිකයින් සංඛ්‍යාව | මුදල (රු. මිලියන) |
|---|---|---|
| ජනවාරි | 3,155 | 3,937 |
| පෙබරවාරි | 2,938 | 3,279 |
| මාර්තු | 3,263 | 3,666 |
| අප්‍රේල් | 3,716 | 4,144 |
| මැයි | 3,567 | 3,718 |
| ජුනි | 2,957 | 3,601 |
| ජූලි | 3,474 | 4,105 |
| අගෝස්තු | 3,722 | 3,979 |
| සැප්තැම්බර් | 2,408 | 2,678 |
| එකතුව | 29,200 | 33,106 |

**අග්‍රහාර රක්ෂණ අරමුදලට අයකිරීම් - 2019 සිට 2024 සැප්තැම්බර් දක්වා**

| වර්ෂය | විශ්‍රාමිකයින් ගණන | මුදල (රු) |
|---|---|---|
| 2019 | 62,061 | 142,274,400 |
| 2020 | 82,184 | 186,384,800 |
| 2021 | 99,922 | 236,468,600 |
| 2022 | 111,618 | 275,226,600 |
| 2023 | 140,684 | 332,413,000 |
| 2024 සැප්තැම්බර් දක්වා | 157,362 | 287,449,600 |

**සක්‍රිය කරන ලද නව විශ්‍රාමිකයන් සංඛ්‍යාව (2024 ජනවාරි - සැප්තැම්බර්)**

| මාසය | සිවිල් | වැ.අ.වි.වැ | හමුදා | එකතුව |
|---|---|---|---|---|
| ජනවාරි | 793 | 583 | 309 | 1685 |
| පෙබරවාරි | 2994 | 872 | 898 | 4764 |
| මාර්තු | 2048 | 877 | 591 | 3516 |
| අප්‍රේල් | 2335 | 1065 | 930 | 4330 |
| මැයි | 888 | 517 | 343 | 1748 |
| ජුනි | 2035 | 801 | 596 | 3432 |
| ජූලි | 2356 | 979 | 825 | 4160 |
| අගෝස්තු | 2250 | 909 | 751 | 3910 |
| සැප්තැම්බර් | 2638 | 889 | 868 | 4395 |
| එකතුව | 18,337 | 7492 | 6111 | 31940 |

**දිස්ත්‍රික් පදනමින් විශ්‍රාමිකයින් සංඛ්‍යාව සහ වියදම - 2024 සැප්තැම්බර්**

| දිස්ත්‍රික්කය | විශ්‍රාමිකයින් ගණන | මුදල (රු.) |
|---|---|---|
| ගම්පහ | 90,791 | 3,710,659,574 |
| කොළඹ | 89,601 | 3,851,242,180 |
| කුරුණෑගල | 70,408 | 3,009,258,244 |
| මහනුවර | 62,740 | 2,660,620,653 |
| කළුතර | 46,382 | 1,887,855,850 |
| අනුරාධපුර | 41,283 | 1,759,237,204 |
| ගාල්ල | 40,335 | 1,666,633,387 |
| කෑගල්ල | 34,800 | 1,460,832,816 |
| බදුල්ල | 29,746 | 1,233,302,571 |
| මාතර | 29,448 | 1,224,940,921 |
| රත්නපුර | 24,831 | 1,038,072,634 |
| මාතලේ | 19,441 | 817,510,167 |
| හම්බන්තොට | 18,249 | 758,003,954 |
| පුත්තලම | 16,389 | 670,096,400 |
| යාපනය | 15,408 | 629,399,975 |
| අම්පාර | 15,299 | 660,350,367 |
| මොනරාගල | 13,168 | 541,151,553 |
| පොළොන්නරුව | 12,785 | 519,448,821 |
| නුවරඑළිය | 12,229 | 494,220,822 |
| මඩකළපුව | 9,333 | 396,872,745 |
| ත්‍රිකුණාමලය | 9,220 | 385,733,653 |
| විදේශ විශ්‍රාම වැටුප් | 7,802 | 296,505,526 |
| වව්නියාව | 3,246 | 140,614,079 |
| මන්නාරම | 1,792 | 74,051,802 |
| කිලිනොච්චි | 1,340 | 50,880,207 |
| මුලතිව් | 1,281 | 55,642,818 |
| එකතුව | 717,347 | 29,993,138,920 |

**විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දායකත්වය**

| ආයතනය | විශ්‍රාමිකයින් ගණන |
|---|---|
| තැපැල් කාර්යාල | 20,026 |
| ග්‍රාමීය බැංකුව | 5,526 |
| සණස සමිති | 200 |
| සර්වෝදය සංවර්ධන මූල්‍ය සමාගම | 66 |
| ලංකා බැංකුව | 181,073 |
| ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 108 |
| කොමර්ෂල් බැංකුව | 10,671 |
| හැටන් නැෂනල් බැංකුව | 16,307 |
| HSBC බැංකුව | 97 |
| මහජන බැංකුව | 247,822 |
| ඉන්දියානු රාජ්‍ය බැංකුව | 2 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 90 |
| NDB බැංකුව | 10,391 |
| මුස්ලිම් වානිජ බැංකුව | 1 |
| සම්පත් බැංකුව | 17,133 |
| සෙලාන් බැංකුව | 3,769 |
| යුනියන් බැංකුව | 19 |
| පෑන් ඒෂියා බැංකුව | 39,849 |
| DFCC වර්ධන බැංකුව | 1,622 |
| අමානා බැංකුව | 645 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 121,351 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 20,965 |
| HDFC බැංකුව | 136 |
| CDB බැංකුව | 2 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 16,267 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 88 |
| LB FINANCE සමාගම | 3,121 |
| එකතුව | 717,347 |

**විශ්‍රාම වැටුප් ගෙවීම (වටිනාකම අනුව) 2024 සැප්තැම්බර්**

| මාසික වැටුප් හා දීමනා (රු) | විශ්‍රාමිකයින් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|
| 20000 ට අඩු | 39,398 | 5.5 |
| 20000 - 29999 | 178,151 | 24.8 |
| 30000 - 39999 | 185,171 | 25.8 |
| 40000 - 49999 | 171,583 | 23.9 |
| 50000 - 59999 | 81,199 | 11.3 |
| 60000 - 69999 | 37,947 | 5.3 |
| 70000 - 79999 | 15,124 | 2.1 |
| 80000 - 89999 | 4,712 | 0.7 |
| 90000 - 99999 | 1.612 | 0.2 |
| 100000 - 149999 | 2,325 | 0.3 |
| 150000 - 199999 | 96 | 0.013 |
| 200000 ට වැඩි | 29 | 0.004 |
| එකතුව | 717,347 | |

**පාරිතෝෂික ගෙවීම් (2020 - 2024 සැප්තැම්බර් දක්වා)**

| වර්ෂය | විශ්‍රාමිකයින් ගණන | වටිනාකම රු. මිලියන |
|---|---|---|
| රු. බිලියන 29 (2020) | 31,090 | 29,006 |
| රු. බිලියන 28 (2021) | 30,262 | 28,595 |
| රු. බිලියන 21 (2022) | 21,199 | 21,178 |
| රු. බිලියන 64 (2023) | 55,091 | 64,698 |
| රු. බිලියන 33 (2024) | 29,200 | 33,106 |

**සක්‍රිය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ බෙලහීනතාවයට පත් ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයන්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම (2024 සැප්තැම්බර් දක්වා)**


| ආයතනය | මාසික සංඛ්‍යාව (සැප්තැම්බර්) | ගෙවූ මුදල රු. මිලියන |
|---|---|---|
| යුද්ධ හමුදා | 33296 | 29631 |
| නාවික හමුදා | 1444 | 1207 |
| ගුවන් හමුදා | 484 | 368 |
| පොලිස් | 1,692 | 1583 |
| ස්ථාවර දීමනා ගෙවීම් | 3099 | 932 |
| රු.5000 දීමනා ගෙවීම් | 34645 | 1179 |
| එකතුව | | 34900 |

**ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන් සඳහා ස්ථාවර මාසික දීමනා ගෙවීම 2024 සැප්තැම්බර් දක්වා**


| මාසය | පුද්ගලයින් සංඛ්‍යාව | මුදල රු. මිලියන |
|---|---|---|
| ජනවාරි | 2,891 | 93 |
| පෙබරවාරි | 2,938 | 105 |
| මාර්තු | 2,981 | 102 |
| අප්‍රේල් | 3,029 | 97 |
| මැයි | 3,093 | 111 |
| ජුනි | 3,135 | 100 |
| ජූලි | 3,166 | 101 |
| අගෝස්තු | 2,796 | 100 |
| සැප්තැම්බර් | 3,099 | 123 |
| එකතුව | | 932 |

**වැන්දඹු, වැන්දඹු පුරුෂ අනත්දරු අරමුදල්හි දායක මුදල් ආදායම 2019 සිට 2024 සැප්තැම්බර් දක්වා**

| වර්ෂය | සමාජ සංරක්ෂණ දායක මුදල (මධ්‍යම රජය) | සමාජ සංරක්ෂණ දායක මුදල (පළාත් සභා) | එකතුව (රු) |
|---|---|---|---|
| 2019 | 19,001,657,912 | 10,029,618,701 | 29,031,276,613 |
| 2020 | 21,410,395,013 | 11,024,652,894 | 32,435,047,907 |
| 2021 | 22,595,155,045 | 12,054,484,364 | 34,649,639,409 |
| 2022 | 23,872,352,903 | 13,543,311,342 | 37,415,664,245 |
| 2023 | 22,716,778,374 | 13,561,986,537 | 36,278,764,911 |
| 2024 සැප්තැම්බර් දක්වා | 17,287,166,691 | 11,843,816,864 | 29,130,983,555 |




පාරිතෝෂික ගෙවීම් (2020 – 2024 සැප්තැම්බර් දක්වා )




LAKE HOUSE
දැන්වීම් අතිරේක අංශය
☎: 0112 429 339, 0777 270 076
සම්බන්ධීකරණය
මහේෂ් වලල්ගොඩ
පිටු සැකසුම
සත්සරණී පෙරේරා